www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඇෆ්ගනිස්ථානයේ එක්සත් ජනපද ජීවිත හානිය දහස ඉක්මවයි

## US death toll in Afghanistan tops 1,000

**2010 මැයි 19**

18 දා කාබුල් නගරයේ නේටෝ හට කන්ඩායමකට එල්ලවූ සුවිසල් මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයෙන් තවත් එක්සත් ජනපද සොල්දාදුවන් පස් දෙනෙක්, කැනේඩියානු නිලධාරියෙක් හා ඇෆ්ගන් සිවිල් වැසියන් ගනනාවකගේ ජීවිත විනාශ විය.

ප්‍රහාරය ප්‍රදර්ශනය කරන්නේ ජනාධිපති හමීඩ් කර්සායිගේ රූකඩ ආන්ඩුව කෙසේ වෙතත්, වසර අටකටත් වැඩි එක්සත් ජනපදයේ නායකත්වයෙන් යුත් ආක්‍රමනකාරී හමුදාවන්ට ඇෆ්ගන් අගනුවරවත් සුරක්ෂිත කිරීමට නො හැකිවී ඇති බවයි. එසේම එය, "දීර්ඝකාලීන නිදහසේ මෙහෙයුම" තුල මිය ගිය මුලු ඇමරිකානු හට සංඛ්‍යාව දහස සලකුනු කල බියකරු සැතපුම් කනුව ඇමරිකානු හමුදාවන්ට මුනගැස්වීය.

මෙම මරන සංඛ්‍යාවේ බරපතලකම පිලිබඳව ඔබාමා පරිපාලනය, ඊට පෙර ධවල මන්දිරයේ සිටි බුෂ් මෙන්ම සැලකිල්ලට ගනු නැති බවට ඇත්තේ සුලු සැකයකි. ධවල මන්දිරයේ ප්‍රකාශයෙකු 18දා ඇමරිකානු හමුදාවන්ගේ "අසාමාන්‍ය කැපකිරීම" වර්නනා කල නමුත් මෙම යුද්ධයේ දී ඇමරිකානු මරන සංඛ්‍යාව දහසක් දක්වා වැඩිවීම ගැන කිසිවක් සඳහන් නො කලේ ය.

කෙසේ වෙතත්, එවැනි ගනන් හිලව් විශාල වැදගත්කමක් සහ බැරෑරුම් ප්‍රතිවාරයන් ඉල්ලා සිටී. වාඩිලාගත් හමුදාවක කොටසක් ලෙස තමන්ට සතුරු ජනගහනයකට එරෙහිව සටන් කිරීමේ රාජකාරියකට නැවත නැවතත් යෙදවීම නිසා සිය ජීවිත භයානක ශාරීරික තුවාල වලින් මෙන්ම ඉමහත් මානසික බලපෑම්වලින් ද කැබලිවී ගිය දහස් ගනන් වෙනත් එක්සත් ජනපද හමුදා භටයන් ගැන සඳහන් නොකලත්, ඒ පිටුපස සිටින්නේ විනාශයට පත් පවුල් සමාජිකයන් හා ආදරය කල අයයි.

2009 දී, හමුදා භටයින් 17,538 ක් මානසික ගැටලු හේතුවෙන් ද සටනේ දී තුවාල වීමෙන් 11,156 දෙනෙක් ද රෝහල් ගත කලේ ය. "යුද්ධය අමාරුයි. එය විනාශය ඇති කරනවා," යැයි හමුදාවේ ලුතිනන්. ජෙනරාල් එරික් ෂූමාකර් සඳහන් කලේ ය.

කුමන යුද්ධයක දී වුවත් එයම කිව හැකි බවට සැකයක් නොමැත. නමුත්, විදේශ ආක්‍රමනයට එරෙහි පුලුල් ජනතා ප්‍රතිරෝධය මැඩලීමට ගෙන යන යුද්ධයක් සඳහාත්, යුද්ධයේ මානුෂික වියදම ආන්ඩුව සහ ඔවුන්ට ගැති මාධ්‍ය මගින් වසන් කරන නිසාත්, මුසාවන් මත පදනම් වූ යුද්ධයක් සඳහා මැරීමට හා මැරී වැටෙන්ට යවන ලද සොල්දාදුවන්ගේ මෙම මානසික වන්දිය තියුනු ලෙස වැඩි දියුනු වී ඇත.

දහසක් ඇමරිකානු සොල්දාදුවන් මියගියේ කුමක් සඳහා ද? ශාරීරිකව හා මානසිකව විනාශ කරන ලද තවත් දහස් ගනනක් වෙනුවෙන් වූ යුක්තිය කුමක් ද? එක්සත් ජනපද ඉතිහාසයේ දෙවන දීර්ඝතම යුද්ධයේදී ගත වු මාස 103 ක කාල සීමාව තුල මරාදැමූ හා අංග විකල කරන ලද දස දහස් ගනනක් ඇෆ්ගන් මිනිසුන් පිලිබඳව සමාවට කිව හැක්කේ කුමක් ද ?

ඇමරිකානු අධිරාජ්‍යවාදය ඇෆ්ගනිස්ථානය තුල සටන් කරමින් සිටින්නේ ඇමරිකානු භූමිය මත තවත් ත්‍රස්තවාදී ප්‍රහාරයක් වලක්වා ගැනීමටය යන, බුෂ්ගේ සහ චෙනිගේ ප්‍රකාශ ප්‍රතිරාවය කරන ඔබාමා පරිපාලනයේ කියාපෑම්, තම ත්‍රස්ත විරෝධී මෙහෙයුම් වල අරමුන ස්වදේශික ප්‍රතිරෝධය මැඩීමට යයි ද, රට තුල ක්‍රියාත්මකව සිටින්නේ 100 කට නො වැඩි අල්කයිඩා සමාජිකයන් සංඛ්‍යාවක් පමනක් බව ද පිලිගෙන තිබෙන හමුදා නායකයින් විසින් ම අවමානයට ලක්කර කර ඇත.

කෙටියෙන් කිවහොත් එය, 19 වන සියවසේදී ඇමරිකාවේ ආදි වාසීන් සාමයට කැමතිකරවා ගැනීමට ඔවුන්ට එරෙහිව එක්සත් ජනපද හමුදා ගෙනගිය වර්ගයේ මෙහෙයුම් හෝ 20 වන සියවසේ මුල පිලිපීනුවන්ට සහ හයිටි වැසියන්ට එරෙහිව ගෙන ගිය යුද්ධවල ස්වභාවය ගෙන තිබේ. අප්‍රිකාවේ, ආසියාවේ සහ මැදපෙරදිග යටත් විජිත විරෝධී ව්‍යාපාර මැඩීමේ දී ප්‍රන්සයේ, පෘතුගාලයේ සහ බ්‍රිතාන්‍යයේ හමුදාවන් විසින් යොදාගත් සාපරාධී භාවිතාවන්ට සමාන කමක් ද මෙහිදී දැකිය හැකිය.

ඇමරිකානු භටයන් මිය යන්නේ, මංග යුද දෙටුවන් කන්ඩායමක් හා සීඅයිඒ මුදල් වලින් සන්තෝසම් ලබන හෙරෝයින් ජාවාරම්කරුවන් නියෝජනය කරන, එහෙත්, එක්සත් ජනපද මිලිටරියේ ම සමීක්ෂන වලට අනුව රටේ කිසිදු කොටසකින් සහයෝගයක් නොලබන හා කිසිදු සැලකිය යුතු මහජන පදනමකින් තොර, හමීඩ් කර්සායිගේ දූෂිත රූකඩ තන්ත්‍රය නගාසිටුවීමටය.

අවසාන විග්‍රහයේ දී මෙම සොල්දාදුවන් මිය යන්නේ, 2001 සැප්තැම්බර් 11 සිද්ධීන්ට පෙරාතුව විස්තාරනය කල, ඇෆ්ගනිස්ථානයට යාබද විශේෂයෙන් ම චීනය, රුසියාව, ඉරානය, පකිස්ථානය සහ ඉන්දියාවට විශාල වැදගත්කමක් උසුලන බලශක්ති සැපයුම් සහ තෙල් නල මාර්ග මත එක්සත් ජනපද ආධිපත්‍යය පිහිටුවීම එල්ල කරගත් ආක්‍රමනයේ මූලෝපාය ක්‍රියාවේ යෙදවීම සඳහා ය.

ඇෆ්ගනිස්ථානයේ පමනක් නොව එක්සත් ජනපදයේ ද කම්කරු පන්තියේ වියදමින් මෙම මූලෝපාය සැලසුම් කර ඇත්තේ, පාලක පන්තියේ තුනී මූල්‍ය පැලැන්තියකට වාසි සැලසෙන පරිදි ය. විරැකියාවට, දිලිඳුභාවයට සහ බිඳවැටෙන සමාජ තත්වයන්ට පිලියම් කිරීමට "මුදල් නැතැයි" ඩිමොක්‍රටික් පාලනය යටතේ ඇති කොන්ග්‍රසය කම්කරු ජනතාවට කියන තත්වය තුල මේ සතියේ දී, තවත් ඩොලර් බිලියන 59 ක් ඇෆ්ගනිස්ථානයේ යුද්ධයටත් එහි වැඩිදුර ව්‍යාප්තියටත් "හදිසි" පනතක් මගින් සම්මත කර ගත්තේ ය.

ඔබාමා පරිපාලනයේ "තල්ලුවේ" ප්‍රතිපලයක් ලෙස මේ ගිම්හානය වන විට, ඇෆ්ගනිස්ථානය තුල එක්සත් ජනපද ආක්‍රමනික හමුදාවන්ගේ සංඛ්‍යාව ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ් වැඩ භාර ගන්නා අවධියේ සිටි සංඛ්‍යාව මෙන් තුන් ගුනයක් වනු ඇත. රට ආරක්ෂා කරනවා වෙනුවට, එක්සත් ජනපදයේ වැඩිවන මිලිටරි වාඩිලෑම පාර කපනු ඇත්තේ ප්‍රචන්ඩ ක්‍රියා හා ජීවිත හානි අඛන්ඩව වැඩිවීමට පමනකි.

එක්සත් ජනපද ආන්ඩුවේ වගකීම් කාර්යාලයෙන් නිකුත් කරන ලද වාර්තාවකට අනුව, එරට ප්‍රමුඛ ආක්‍රමනික හමුදා, මාර්තු මාසය තුල දී සෑම දිනකම සාමාන්‍යයෙන් ප්‍රහාර 40 කට වඩා එල්ල කරන ලද අතර එය 2009 මාර්තුවලට වඩා දෙගුනයකි.

ඒ අතර තුර, පෙන්ටගනයේ හාස්‍යජනක ලෙස පහල ඇස්තමේන්තුවලට අනුව පවා, ඇමරිකාව ප්‍රමුඛ ආක්‍රමනික හමුදාවන්ගේ රාත්‍රී වැටලීම්, බෝම්බ දැමීම්, මුරපොලවලදී වෙඩිතැබීම් සහ ඇමරිකන් හමුදා කන්ඩායම් විසින් එලවා ඝාතනය කිරීම් බහුතරයක් කාන්තාවන් සහ ලමයින් වන අතර, රහසේ ඝාතනය කරන ලද නිරායුද සිවිල් වැසියන්ගේ සංඛ්‍යාවත් ගිය වසරේ පලමු කාර්තුවේ දීට වඩා මේ වසරේ දෙගුනයක් වී ඇත.

ලේ හැලීම් තියුනුව වැඩි වනු ඇත. දල වශයෙන් ඇමරිකාවේ ඩෙට්‍රොයිට් නගරයයේ ප්‍රමානයට සමාන තලෙයිබාන්වරුන්ගේ බලකොටුවක් වන කන්දහාර් නගරයට මෙහෙයුම් දියත් කිරීමට ඇමරිකානු භටයන් සූදානම් වන විට, ගිම්හානයේදී ප්‍රතිරෝධී හමුදා ප්‍රතිප්‍රහාරය මධ්‍යයේ සිදුවිය හැක්කේ එයයි. "කන්දහාර් ආරක්ෂා කිරීමේ ප්‍රයත්නයේ දී එය විනාශ කිරීම ඇමරිකානු හමුදාවේ එල්ලය නොවන බව" පසුගිය සතියේ රාජ්‍ය ලේකම් හිලරි ක්ලින්ටන්ගේ ප්‍රකාශය එතරම් ඒත්තු යන එකක් නොවේ.

බුෂ් පරිපාලනය යටතේ දියත් කරන ලද හා ඔබාමා විසින් ඉදිරියට ගෙන යන මෙම යුද්ධයට සේම ඉරාක ආක්‍රමනයට ද තිබුනු හා තිබෙන පුලුල් මහජන විරුද්ධත්වය (ඔබාමා විසින් ගසාකන ලද) අතුරුදහන් වී නොමැත. ඇෆ්ගනිස්ථානය තුල ඇමරිකාව ගෙන යන්නේ "යහපත් යුද්ධයක්" යැයි විශාල ලෙස ප්‍රතිරාව නංවන මහා ව්‍යාපාරිකයින්ගේ ද්වි පක්ෂවලින් හෝ ජන මාධ්‍ය තුලින් හෝ මීට කුමන හෝ ප්‍රකාශනයක් සොයා ගත නොහැක.

විශේෂයෙන්ම එක දිගට පැවති මැතිවරනවල දී මෙම යුද්ධයන්ට තම විරුද්ධත්වය ප්‍රකාශ කිරීමට විශාල මහජනතාවක් ඡන්දය පාවිච්චි කිරීමට යෑමෙන් පසුව හා, මෙම පලල් මහජන මනෝගතිය ගසාකමින් 2008 දී ජනාධිපති ලෙස බලයට පැමිනීමෙන් පසුව බැරැක් ඔබාමා, ඇෆ්ගනිස්ථානයේ සහ පකිස්ථානයේ එක්සත් ජනපද මිලිටරි ආක්‍රමනය නාටකාකාර ලෙස ඉහල නැංවීමට පමනක් කටයුතු කිරීමෙන් ද අනතුරුව, පවත්නා දේශපාලන පර්යාය තුල කිසිවක් කල නොහැකි බවට පුලුල් අවබෝධයක් ජනනය කර ඇතැයි යන්න ගැන සැකයක් නැත.

එසේම බුෂ්ට එරෙහිව ඩිමොක්‍රටිකයන්ට සහයෝගය දීමෙන් යුද්ධය නවතා ගත හැකි යැයි කියූ මධ්‍යම පන්තික යුද විරෝධී ව්‍යාපාර සංවිධායකයින්ගේ ඉදිරිදර්ශනයේ බංකොලොත් භාවයත්, ඔබාමා පරිපාලනයේ ගත වු මාස 15 ක අත්දැකීම් මගින් හෙලිදරව් කර තිබේ. බුෂ් පාලනය අවසන්ව තිබියදීත්, කොන්ග්‍රසයේ මන්ඩල දෙකම ඩිමොක්‍රටිකයන් විසින් පාලනය කරද්දීත්, යුද අපරාධ එක දිගට සිදු වේ. ඔබාමාගේ "ප්‍රගතිශීලී" න්‍යාය පත්‍රයට අනුගත වී සිටින විරෝධතා සංවිධාන, ඔවුන්ගේ පාර්ශවයෙන් නිදිවැදී සිටිති.

මිලිටරිවාදයේ මූලාශ්‍රය වන ධනේශ්වර ලාභ පද්ධතියට එරෙහිව කම්කරු පන්තියේ ස්වාධීන සමාජවාදී ව්‍යාපාරයක් ගොඩනැගීමෙන් පමනක්, යුද්ධයට එරෙහිව අව්‍යාජ අරගලයක් දියත් කල හැකිය.

මැද පෙරදිගින් සහ මධ්‍යම ආසියාවෙන් එක්සත් ජනපද හා අනෙකුත් විදේශ හමුදා වහාම ඉවත් කල යුතු යැයි මෙම ව්‍යාපාරය බල කර සිටිය යුතුය. එය තවදුරටත්, ඇමරිකානු යුද යාන්ත්‍රනය බිඳ දැමීම සඳහාත් ඩොලර් ට්‍රිලියන ගනනක මිලිටරි වියදම් ඇමරිකානු යුද්ධ සහ ආක්‍රමන මගින් විනාශ වු ජන සමාජයන් ප්‍රකෘතිමත් කිරීමට සහ ඇමරිකාව තුලම වැඩකරන ජනතාව මුහුනපා සිටින දැවෙන සමාජ අර්බුදය විසඳීම සඳහා යෙදවීටත් සටන් වැදිය යුතු ය.

බිල් වෑන් ඕකන්.

© www.wsws.org